# තනතුරු ඇබෑර්තු

**ශ්‍රී ලංකා පොලිස් වෛද්‍ය සේවා කොට්ඨාසයේ පවතින වෛද්‍ය පුරප්පාඩු පිරවීම සඳහා රාජ්‍ය සේවයේ හා පෞද්ගලික සේවයේ වෛද්‍ය නිලධාරීන් බඳවා ගැනීම**

පොලිස් වෛද්‍ය සේවා කොට්ඨාසයේ පවත්නා පහත සඳහන් වෛද්‍ය නිලධාරි පුරප්පාඩු සපුරාලීම සඳහා දැනට රාජ්‍ය සේවයේ හා පෞද්ගලික සේවයේ, සේවයේ නියුතු වෛද්‍යවරුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

- විශේෂඥ ශල්‍ය වෛද්‍ය තනතුරු 01
- කායික රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍ය තනතුරු 01
- විශේෂඥ විකිරණවේදී වෛද්‍ය තනතුරු 01
- සායනික පෝෂණය පිළිබඳ විශේෂඥ වෛද්‍ය තනතුරු 01
- නිර්වින්දන විශේෂඥ වෛද්‍ය තනතුරු 01
- සාමාන්‍ය වෛද්‍ය තනතුරු 16
- දන්ත ශල්‍ය වෛද්‍ය තනතුරු 04

02. සුදුසුකම් සපුරා ඇති වෛද්‍යවරුන් පහතින් දක්වා ඇති ආකෘති පත්‍රය අනුව, සකස් කරන ලද අයදුම්පත්‍රය අදාළ සහතිකවල පිටපත් ද සමඟ බහා එවනු ලබන කවරයේ වම් පස ඉහළ කෙළවරෙහි ඔබ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කර 2025.10.27 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ අධ්‍යක්ෂ, බඳවා ගැනීම්, අංක 375, ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති මාවත, කොළඹ 06 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. එදිනට පසුව ලැබෙන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් අයදුම්පත්‍ර පුද්ගලිකව භාර නොදිය යුතුය.

03. **සුදුසුකම් හා පළපුරුද්ද - විශේෂඥ වෛද්‍ය (උපසේවා ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි)**

3.1 ක්ෂේත්‍රයට අදාළව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් පශ්චාත් වෛද්‍ය උපාධිය ලබා තිබීම

3.2 ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ විශේෂඥ වෛද්‍යවරයෙකු ලෙස යාවත්කාලීන කරන ලද පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම.

3.3 ක්ෂේත්‍රයට අදාළව අවම වසර 01 ක පශ්චාත් පත්වීම් පළපුරුද්ද ලබා තිබීම

04. **සුදුසුකම් හා පළපුරුද්ද - සාමාන්‍ය වෛද්‍ය (උපසේවා සහකාර පොලිස් අධිකාරි)**

4.1 M.B.B.S. හෝ ඒ හා සමාන විදේශ වෛද්‍ය උපාධියක් ලබා තිබීම.

4.2 ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ යාවත්කාලීන කරන ලද පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම.

4.3 මේ සඳහා රාජ්‍ය අංශය මෙන්ම පෞද්ගලික අංශයේ ද ඕනෑම වෛද්‍යවරයකුට අයදුම්කළ හැකිය.

**05. සුදුසුකම් හා පළපුරුද්ද - දන්ත ශල්‍ය වෛද්‍ය (උපසේවා සහකාර පොලිස් අධිකාරි)**

5.1 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්වවිද්‍යාලයක දන්ත වෛද්‍ය උපාධියක් හෝ ඒ හා සමාන දන්ත වෛද්‍ය උපාධියක් සමත්ව තිබීම .

5.2 ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ යාවත්කාලීන කරන ලද පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම.

5.3 **රාජ්‍ය අංශය මෙන්ම පෞද්ගලික අංශයේ ද ඕනෑම වෛද්‍යවරයකුට අයදුම්කළ හැකිය.**

**06.** වැටුප් හා වෙනත් දීමනා සහ පහසුකම් :

| *රාජ්‍ය සේවයෙන් ඉල්ලුම්කරන වෛද්‍යවරුන් හට දීමනා හා පහසුකම්* | | *පෞද්ගලික සේවයෙන් ඉල්ලුම්කරන වෛද්‍යවරුන් හට වැටුප්, දීමනා හා පහසුකම්* |
|---|---|---|
| උප සේවා ස.පො.අ./ පො.අ./ජ්‍යෙ.පො.අ/ (වෛද්‍ය) නිලධාරි තනතුරට සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය නිලධරයන් තාවකාලිකව මුදා හැරීමේ දී ගෙවන වැටුප | | උප සේවා ස.පො.අ./ පො. අ. / ජ්‍යෙ.පො.අ./ (වෛද්‍ය) නිලධාරි තනතුරට අංක අමප/**15/0240/606/2013** දරන **2015.04.23** දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය යටතේ සෘජුව වෛද්‍යවරුන් බඳවා ගැනීමේ දී ගෙවන වැටුප **(සියලු වැටුප් හා දීමනා ශ්‍රී ලංකා පොලීසිය මඟින් ගෙවනු ලැබේ.)** |
| අදාළ වෛද්‍යවරයා සෞඛ්‍ය අමාත්‍යාංශයේ දරන නිත්‍ය තනතුරට අදාළව සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් ගෙවනු ලබන වැටුප් හා දීමනා ශ්‍රී ලංකා පොලීසිය මගින් ප්‍රතිපූරණය කරනු ලැබේ. | | මූලික වැටුප :<br>උපසේවා ස.පො.අ (වෛද්‍ය) රු. 82,150<br>උපසේවා පො.අ (වෛද්‍ය) රු. 98,950<br>උපසේවා ජ්‍යෙ.පො.අ (වෛද්‍ය) රු. 112,030 |
| අමතර සේවා දීමනාව (උපරිම පැය 120 සඳහා) සත්‍ය වශයෙන් සේවය කරනු ලබන පැය ගණන පදනම් ව ශ්‍රී ලංකා පොලීසිය මගින් ගෙවනු ලැබේ | | විශේෂ දීමනාව<br>රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/2025 අනුව වැටුපෙන් 22% ක් සමග රු. 1,250/- |
| ප්‍රවාහන පහසුකම් | | ජීවන වියදම් දීමනාව - රු. 17,800 |
| | | දුෂ්කර දීමනාව - රු. 2,000 |
| | | නිල ඇඳුම් පිරිසිදු කිරීමේ දීමනාව - රු. 250 |
| | | ආහාර හා නවාතැන් දීමනාව රු. 34,800 |
| | | ප්‍රවාහන පහසුකම් |

6.1 රාජ්‍ය සේවයෙන් බඳවා ගනු ලබන වෛද්‍යවරුන් පොලිස් උප සේවයේ ද්විතීයන පදනම මත ද, ඉන් පරිබාහිරව බඳවාගනු ලබන වෛද්‍යවරුන් උපසේවා පදනම මත ද බඳවාගැනීම සිදුකරනු ලබයි.

6.2 ද්විතියන පදනම මත බඳවා ගන්නා වෛද්‍යවරුන් සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ගෙවනුලබන වැටුප් වර්ධක සහ සියලු දීමනා ලබාගැනීමට හිමිකම් ඇති අතර මෙම බඳවා ගැනීම සෞඛ්‍ය සේවයේ ජ්‍යෙෂ්ඨත්වයට බලපෑමක් ඇති නොවේ.

6.3 උපසේවා පදනමින් බඳවා ගන්නා වෛද්‍යවරුන් හට එම තනතුරට හිමි වැටුප්, දීමනා හා පහසුකම් සපයනු ලැබේ.

6.4 ප්‍රවාහන පහසුකම් අනුමත දීමනා සහ ඒ ඒ තනතුරට අදාළ අනෙකුත් පහසුකම් සපයනු ලැබේ.

07. සේවා කොන්දේසි :

7.1 පොලිස් ආඥාපනතේ විධිවිධාන ඇතුළුව ජාතික පොලිස් කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, කොන්දේසි සහ චක්‍රලේඛ, ආයතන සංග්‍රහයේ විධි විධාන, මුදල් රෙගුලාසි, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, භාණ්ඩාගාර චක්‍රලේඛ, ශ්‍රී ලංකා පොලිස් නියෝග, පොලිස් *ගැසට්* නිවේදන, පොලිස්පති චක්‍රලේඛ, වෙනත් උපදෙස් සංග්‍රවල විධිවිධාන සහ පත්වීම් ලිපියේ ඇතුළත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

7.2 සෑම පත්වීමක් සම්බන්ධයෙන් ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 2310/29 හා 2022.12.14 දිනැති අති විශේෂ *ගැසට්* පත්‍රයේ ප්‍රකාශිත කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

7.3 තෝරාගනු ලබන අයදුම්කරුවන්/අයදුම්කාරියන් පත්වීම් ලැබීමට පෙර පසුබිම් පරීක්ෂණයට ලක්කරනු ලබන අතර පොලිස් සේවයට නුසුදුසුවන අයදුම්කරුවන් අයදුම්කාරියන් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**08.** **අයදුම්පත සමඟ පහත සහතිකපත්වල පිටපත් ඉදිරිපත් කළ යුතුය.**

- **උප්පැන්න සහතිකය**
- **ජාතික හැඳුනුම්පත / විදේශ ගමන් බලපත්‍රය**
- **වෛද්‍ය සභාව විසින් නිකුත් කරන ලද හැඳුනුම්පත**
- **වෛද්‍ය උපාධි සහතිකය**
- **ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ වලංගු ලියාපදිංචි සහතිකය**
- **වෛද්‍ය වෘත්තියට අදාළ විශේෂ සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතික**

- වැඩි විස්තර සඳහා විද්‍යුත් ලිපිනය - dir.ro@police.gov.lk

ප්‍රියන්ත වීරසූරිය,
පොලිස්පති.

2025 සැප්තැම්බර් මස 14 වැනි දින.

**ආදර්ශ අයදුම්පත්‍රය**

01. අයදුම්කරනු ලබන තනතුර : ..........................................................
02. අයදුම්කරුගේ/ අයදුම්කාරියගේ සම්පූර්ණ නම : ................................................................
03. අයදුම්කරුගේ/ අයදුම්කාරියගේ මුලකුරු සමග නම : ..........................................................
04. මුලකුරුවලින් හැඳින්වෙන නම් :.....................................................................................
05. ස්ථිර ලිපිනය :...........................................................................................................
06. ස්ථිර ලිපිනයට අදාළ පොලිස් වසම : ..................................................................
    i. ලිපිහුවමාරු ලිපිනය : ...............................................................
    ii. දුරකථන අංකය : ..........................................................................
    iii. විද්‍යුත් තැපැල් ලිපිනය : ..........................................................................
07. උපන් දිනය : ..................................................................................
08. ජාතික හැඳුනුම්පත් අංකය : ...................................................................................
09. ස්ත්‍රී /පුරුෂ භාවය :..................................................................................
10. දැනට සේවය කරන රෝහල : ...................................................................................
11. දැනට දරන තනතුර :...............................................................................
12. වර්තමාන තනතුරට පත්වූ දිනය :.........................................................................
13. වෘත්තිය සුදුසුකම් :.................................................................................
14. විශේෂ සුදුසුකම් හා පළපුරුද්ද :.......................................................................

ඉහත සඳහන් තොරතුරු, විස්තර සත්‍ය හා නිවැරදි බවට මම සහතික කරමි. මා විසින් සපයන ලද කිසිදු තොරතුරක් අසත්‍ය බවට තෝරාගනු ලැබීමට පෙර සොයාගනු ලැබුවහොත් නුසුදුස්සකු බවට පත්කරනු ලැබීමට හා පත්වීම ලැබීමෙන් පසු හෝ සොයාගනු ලැබුවහොත් කිසිදු වන්දි ගෙවීමකින් තොරව පොලිස් සේවයෙන් පහකරනු ලැබීමට ද මා යටත්වන බවට දන්වා සිටිමි.

..................................................,
අයදුම්කරුගේ/ අයදුම්කාරියගේ අත්සන.

09-222